# "සොබා රූ"

පරිසර අසිරිය

**සාමාජික ඡායාරූප තරඟය සහ ප්‍රදර්ශනය - 2019**

ඡායාරූප තරඟය අංශ **2** කින් පැවැත්වේ.

1. ආධුනික අංශය
2. විවෘත අංශය

**තරඟ කොන්දේසි**

තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන ඡායාරූප ශ්‍රී ලංකාව තුල ගනු ලැබූ ඡායාරූප විය යුතුය.
එක් අයකු හට ඡායාරූප **10**ක උපරිමයකට යටත්ව ඡායාරූප ඉදිරිපත් කල හැක්කේ එක් අංශයකට පමණක් වේ.
ආධුනික අංශයට ඡායාරූප ඉදිරිපත් කල හැක්කේ මෙම වසරේ (**2019**) ඡායාරූප පාඨමාලා හදාරන සිසුන් හට පමණි.
විවෘත අංශයට ඡායාරූප ඉදිරිපත් කල හැක්කේ යාවජීව සහ නොකඩවා සාමාජික මුදල් ගෙවා ඇති සාමාජිකයින් හට පමණි.
ඩිජිටල් ඡායාරූප **CD/DVD** තැටි මගින් ඉදිරිපත් කල යුතුය.
විනිශ්චය සඳහා **300dpi** විභේදනයෙන් යුත් උපරිම සිරස් හෝ තිරස් මාන පික්සල **1080 x 1920** යුත් ඡායාරූප උපරිම **2MB** ප්‍රමාණයේ ගොනුවකද, තෝරා ගතහොත් ඡායාරූප මුද්‍රණය සඳහා කොට පැත්ත අඟල් **12** වන පරිදි තවත් ගොනුවකද වශයෙන් ගොනු දෙකක් ලෙස ඉදිරිපත් කල යුතුය.
ඩිජිටල් ඡායාරූප නාමකරණයේදී (**File Naming**) ඒ සඳහා මාතෘකාව හෝ එහි මුල් කොටස යොදාගත හැක.
ඡායාරූප සඳහා යොදන මාතෘකා උපරිම වශයෙන් අකුරු **25**කට සීමා විය යුතුය.

සෑම ඡායාරූපයකම අංශය, අංකය, මාතෘකාව, ශිල්පියාගේ නම සහ ලිපිනය අයදුම් පත්‍රයේ පැහැදිලිව සටහන් කල යුතුය. අයදුම් පත්‍රයේ ඡායා පිටපත්ද බාර ගනු ලැබේ.
ප්‍රදර්ශනය සඳහා සුදුසුකම් ලැබූ ඡායාරූප මෙම සංගමයේ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීමේ අයිතිය සංගම සතු වන අතර ඒ සඳහා ගෙවීමක් සිදු කරනු නොලැබේ.

මීට පෙර ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කර ත්‍යාග දිනූ ඡායාරූප මෙම ප්‍රදර්ශනය සඳහා බාර ගනු නොලබන අතර එවැනි ඡායාරූප විනිශ්චයෙන් පසුව හෝ හඳුනාගතහොත් ඉවත් කිරීමේ අයිතිය සහ සියළු සහතිකපත් සහ ත්‍යාග අවලංගු කිරීමේ අයිතිය ප්‍රදර්ශන කමිටුව සතුවේ.
ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරනු ලබන කෘතීන් සුරක්ෂිතව භාවිතා කිරීමට සංගමය සෑම උත්සාහයක්ම දරනු ලබන අතර තැපෑලේදී නැතිවන හෝ හානි වන කෘතීන් පිළිබඳව සංගමය වගකියනු නොලැබේ.

ප්‍රදර්ශනය සඳහා කෘතීන් ඉදිරිපත් කිරීමෙන් ඉහත නීති රීති පිළිගත් බවට සළකනු ලබන අතර ඡායාරූප තේරීමේ අවසාන තීරණය විනිශ්චය මණ්ඩලය සතුවේ. තවද ඡායාරූප විනිශ්චය කිරීමෙන් අනතුරුව හෝ තරඟ කොන්දේසි වලට අනුකූල නොවන ඡායාරූප පිළිබඳව දැන ගැනීමට ලැබුන හොත් එම ඡායාරූප ප්‍රදර්ශනයෙන් ඉවත් කිරීමේ සම්පූර්ණ බලය ප්‍රදර්ශන කමිටුව සතු වන අතර ඒ පිළිබඳ කිසිදු ලිපි ගනුදෙනුවක් නොකෙරේ.

ප්‍රදර්ශණයට ඉදිරිපත් කරනු ලබන ඡායාරූප ආපසු එවනු නොලැබේ.

**ඇතුල්වීමේ ගාස්තු:**
**විවෘත අංශය සඳහා ඇතුලත් වීමේ ගාස්තු වශයෙන් රු: 1000/- ක්ද ආධුනික අංශය සඳහා රු: 750/- ක්ද අය කරනු ලැබේ.**

**ඡායාරූප භාර දිය යුතු හෝ එවිය යුතු ලිපිනය සහ අවසන් දිනය:**
**මැයි මස 26 වැනි දින හෝ එදිනට පෙර. ( ගෙනවිත් බාර දෙනු ලබන ඡායාරූප සඳුදා දිනයන් හැර )**

සොබා රූ ඡායාරූප තරඟය සහ ප්‍රදර්ශනය - **2019**
ජාතික ඡායාරූප ශිල්පීන්ගේ සංගමය
**290**, ඩී.ආර්. විජයවර්ධන මාවත
කොළඹ **10**.

**ප්‍රදර්ශනය:**
ස්ථානය සහ දිනය පසුව දැනුම් දෙනු ලැබේ.
ප්‍රදර්ශනය පිළිබඳ වැඩි විස්තර ජාතික ඡායාරූප ශිල්පීන්ගේ සංගමයේ වෙබ් අඩවිය වන **www.napsl.com** වෙතින් ලබා ගත හැක.

**"සොබා රූ"**

පරිසර අසිරිය

**සාමාජික ඡායාරූප තරඟය සහ ප්‍රදර්ශනය - 2019**

**අයදුම් පත්‍රය**

අංශය: ආධුනික / විවෘත

නම: ......................................................................................................................................

ලිපිනය: ....................................................................
....................................................................
....................................................................

දුරකථන අංකය: .....................................................................

විද්‍යුත් තැපැල: .......................................................................

**2019** සොබා රූ සාමාජික ඡායාරූප ප්‍රදර්ශනය සඳහා මවිසින් පහත සඳහන් ඡායාරූප ඉදිරිපත් කරන අතර ප්‍රදර්ශනයේ නීති රීති වලටද එකඟ වෙමි. ඇතුලත් වීමේ ගාස්තු වශයෙන් රු:................ ක මුදලක් / චෙක් පතක් / මුදල් ඇනවුමක් (අංක:..............................) මේ සමඟ එවමි.

| ......................... | ................................ | ................ |
|---|---|---|
| අත්සන | සාමාජික / ශිෂ්‍ය අංකය | දිනය |

| | මාතෘකාව | කාර්යාල ප්‍රයෝජනයට |
|---|---|---|
| **01.** | | |
| **02.** | | |
| **03.** | | |
| **04.** | | |
| **05.** | | |
| **06.** | | |
| **07.** | | |
| **08.** | | |
| **09.** | | |
| **10.** | | |